# සුපිළිපන් ප්‍රණාම
# 2021

integrity icon
Sri Lanka

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

accountabilitylab

# සුපිළිපන් ප්‍රණාම
# 2021

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

accountabilitylab

# සුපිළිපන් ප්‍රණාම
# 2021

මුද්‍රණය 2021 ජුලි

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
නො 5/1 එලිබෑන්ක් පාර
කොළඹ 05
ශ්‍රී ලංකාව

අප ආයතනය අගෝස්තු 15 වන දින තෙක් ඉහත ලිපිනයේ වැඩ කටයුතු කරන අතර ඉන්පසු (අගෝස්තු 15 පසු) අප ආයතනය නො 366, නාවල පාර, රාජගිරිය යන ලිපිනයට මාරුවන බව කරුණාවෙන් සලකන්න

දුරකථන: 071 1 295 295 / 076 3 223 442

icon@tisrilanka.org
www.integrityicon.lk

facebook.com/tisrilanka
twitter.com/tisrilanka

(සියළුම හිමිකම් ඇවිරිණි)
මෙහි අන්තර්ගත කිසියම් හෝ කරුණක් නැවත ප්‍රකාශයට පත් කිරීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙහි ලිඛිත අවසරය ලබා ගත යුතු වේ.

# පටුන


| | |
|---|---|
| ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය යනු කුමක්ද ? | 02 |
| පාර්ශවකාර ආයතන | 02 |
| සුපිළිපන් සම්මාන 2021 | 03 |
| යෝග්‍යතාවය/සුදුසුකම් | 06 |
| නිර්ණායක | 07 |
| 2021 සුපිළිපන් සම්මාන ක්‍රියාවලිය | 08 |
| නාමයෝජනා ලබා දීම | 09 |
| විනිසුරු මණ්ඩලය | 09 |
| සම්මාන උළෙල | 10 |
| ඇමුණුම් | 11 |

# 01. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය යනු කුමක් ද?

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ස්වාධීන, රාජ්‍ය නොවන, ලාභ නොලබන ආයතනයක් වන අතර ජාත්‍යන්තර ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයෙහි දේශීය ශාඛාව වේ. යහපාලනය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ  දූෂණය දුරලීම සඳහා මෙම ආයතනය කැප වී සිටියි. දූෂණය මගින් ඇති කරනු ලබන අහිතකර ප්‍රතිවිපාක පිලිබඳව සමාජයට දැනුවත්භාවයක් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය විසින් ලබා දෙන අතර එය දුරලීම සඳහා ඵලදායී ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා රජය, ව්‍යාපාරික ප්‍රජාව සහ සිවිල් සමාජයෙහි පාර්ශ්වකරුවන් සමග එක්ව ක්‍රියාකාරීව කටයුතු කරනු ලබයි.

# පාර්ශවකාර ආයතන

## Accountability Lab ආයතනය

ලොව පුරා සක්‍රීය  පුරවැසියන් සහ වගකීමක් සහිත නායකයන් නිර්මාණය කිරීම සඳහා ක්‍රියා කරනු ලබන ස්වාධීන, ලාභ නොලබන ආයතනයක් ලෙස මෙම ආයතනය හැඳින්විය හැකිය. සාධනීය සමාජීය හා ආර්ථික වෙනස්කම් ඇති කිරීමේ අරමුණ ඇතිව වගවීම් ක්‍රම වේදයන් සවිමත් කිරීම සඳහා පුරවැසියන් පුහුණු කිරීම, ඔවුනට උපදෙස් ලබා දීම සහ ඔවුන් සවිබල ගැන්වීම මෙම ආයතනය විසින් සිදු කරනු ලැබේ.

# 02. සුපිළිපන් ප්‍රණාම 2021

සුපිළිපන් ප්‍රණාම සම්මාන වැඩසටහන යනු පුරවැසියන් විසින් අවංක රජයේ නිලධාරීන් හඳුනාගැනීම උදෙසා පවත්වනු ලබන ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන වැඩසටහනකි. සුපිළිපන්න රාජ්‍ය සේවකයන් හදුනා ගනිමින් ඔවුනට සමාජ පිළිගැනීමක් ඇති කරමින් ආදර්ශමත් රාජ්‍ය සේවයක් සදහා වන ආදර්ශ චරිත බිහි කිරීම මෙහි අරමුණ වේ. රාජ්‍ය සේවයට එකතුවන නව පරම්පරාවට වඩාත් ඵලදායි රාජ්‍ය සේවකයන් පිරිසක් බවට පත් වීමට අවශ්‍ය පෙළඹවීම ලබා දීමටද මෙමගින් අපේක්ෂා කරනු ලැබේ. 2014 වර්ෂයේදි Accountability Lab ආයතනයේ මැදිහත් වීමෙන් නේපාලයේදි ආරම්භ වුනු සුපිළිපන් ප්‍රණාම වැඩසටහන මේ වන විට ලයිබීරියාව, මාලි, මෙක්සිකෝව, මොරොක්කෝව, නේපාලය, නයිජර්, නයිජීරියාව, පාකිස්ථානය, ෆිලඩෙල්ෆියාව, දකුණු අප්‍රිකාව, ශ්‍රී ලංකාව සහ යුක්රේනය යන රටවල ක්‍රියාත්මක වෙමින් පවතී.

සුපිළිපන් ප්‍රණාම සම්මාන උළෙල සදහා නාම යෝජනා යොමු කිරීමේ මහජන උනන්දුව වැඩි කිරීම සදහා ජාතික මට්ටමේ මාධ්‍ය ප්‍රචාරණයක් සුපිලිපන් ප්‍රණාම සම්මාන උළෙලට ලබා දෙනු ඇත. නාම යෝජනා යොමු කරන කාල පරිච්ඡේදය තුල ස්වේච්ඡාවෙන් කටයුතු කරනු ලබන කණ්ඩායමක් විසින් මහජනතාව විසින් යොමු කරන ලද නාම යෝජනාවල සත්‍යභාවය තහවුරු කර ගන්නා අතර එම නාම යෝජනා අතරින් අවසන් වටයට සුදුසුකම් ලබන නාමයෝජනා 20ක් හෝ 30ක් පමණ ස්වාධීන විනිසුරු මඩුල්ලකගේ අධීක්ෂණයට යොමු කිරීමෙන් අනතුරුව අවසාන ජයග්‍රාහකයින් පස්දෙනා විනිසුරු මඩුල්ලේ එකඟතාවය මත තෝරාගනු ලැබේ.

මහජන සුභසිද්ධිය උදෙසා කටයුතු කරනු ලබන පුද්ගලයන් සම්මානයට පත් කිරීම මෙම සුපිළිපන් ප්‍රණාම මගින් ඉටු කරනු ලබන කාර්යයයි. අප විසින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරනු ලබන සමාජ වෙනස පිලිබඳව සහ අප වෙනුවෙන් සේවාවන් සැලසීම සඳහා රාජ්‍ය සේවය තුල නිරත විය යුත්තේ කවර ආකාරයක පුද්ගලයන්ද යන්න පිලිබඳව ධනාත්මක සංවාදයක් ගොඩනැගීම සඳහා මෙම සම්මානය තුලින් පහසුකම් සලසා දෙනු ලැබේ.

## ලොව පුරා සුපිළිපන් ප්‍රණාම සම්මානයෙන් පිදුම් ලැබූවෝ



### ගයන් මානි (අධ්‍යාපන නිළධාරී)
### නේපාලය - 2014

2012 වර්ෂයේදී නේපාලයේ පැන්චිතාර් නැගෙනහිර දිස්ත්‍රික්කයෙහි ප්‍රධාන අධ්‍යාපන නිළධාරියා බවට ගයන් මානි පත් වන අවස්ථාවේදී දිස්ත්‍රික්කයේ පාසල් ගුරුවරුන්ගෙන් 90%ක්ම පාසල් නොපැමිණෙන තත්ත්වයක් තිබුණි. එකල පැන්චිතාර්හි අවුරුදු 14ක් වන පාසල් දරුවන්ගෙන් බොහෝ දෙනෙකුට ලිවීමට කියවීමට හැකියාව නොතිබුනි. රජයේ නිළධාරියෙකු ලෙස ගුරුවරුන්ට එරෙහිව දැඩි සහ නිර්භීත පියවර ගැනීමට ඔහු කටයුතු කළේය. පාසල් නොපැමිණෙන සහ අල්ලස් ලබා ගනු ලබන ගුරුවරුන්ගේ සේවය අත්හිටුවීමට ඔහු කටයුතු කළේය. පාසල් සිසුනට හා දෙමාපියන්ට, ගුරුවරුන්ට එරෙහිව යම් පැමිණිල්ලක් සිදු කිරීමට තිබේ නම් ඒ සඳහා තම පුද්ගලික දුරකථන අංකය විවෘතව තැබීමට ඔහු කටයුතු කළේය. වසර 2 ක් තුළ ගුරුවරුන්ගේ පැමිණීම 90% දක්වා ඉහළ ගියේය. ප්‍රාථමික මට්ටමේ දරුවන් විභාග සමත්වීමේ ප්‍රතිශතය 14% සිට 60% දක්වා වර්ධනය විය. මෙම ප්‍රදේශය තුල හඳුන්වා දෙනු ලැබූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිසාවෙන් සුපිළිපන් ප්‍රණාම සම්මානය 2014 වර්ෂයේදී එරට ජනතාව විසින් ඔහුට පිරිනමන ලදී. මෙලෙස ඔහු වෙත ලබා දෙන ලද පිළිගැනීමත් සමග නේපාලයේ ජාතික අධ්‍යාපන ක්‍රමෝපාය සම්බන්ධයෙන් ඔහුගේ උපදෙස් ලබා ගැනීමට නේපාල රජය කටයුතු කලේය. තම රටවල ප්‍රාථමික අධ්‍යාපනය යහපත් තත්ත්වයකට ගෙන ඒම සඳහා උපදෙස් ලබා දෙන ලෙස මෑතකදී යුරෝපීය රටවල් විසින්ද ඔහුට ආරාධනා කරන ලදී.



## මුසු එම් මුල්බා

### (හෙද නිළධාරිනී/ පවුල් සෞඛ්‍ය සේවිකා)

## ලයිබීරියාව - 2019 ජයග්‍රාහක

මුසු එම්. මුල්බා ලයිබීරියාවේ සෞඛ්‍ය හා සමාජ සුභසාධන අමාත්‍යාංශයට අනුබද්ධව, බාන්ගා බොන්ග් ප්‍රාන්තයේ සී. බී. ඩන්බාර් රෝහලට වාර්තා වන සියලුම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ සිද්ධි සොයා බලමින් සේවය කරයි. ඇය බාන්ගා නගරයේ නගරාධිපතිවරයා විසින් පත් කරන ලද ඩිමෙන්ටා සහ කොකෝයා ප්‍රජාවේ කලාප ප්‍රධානියා ලෙස ද කටයුතු කරයි. මීට අමතරව, ඇය සුවාකෝකෝ හි කට්ටිංටන් විශ්ව විද්‍යාලයේ හෙද අධ්‍යාපනය හදාරමින් සිටී.

ලිංගික අතවරයට ලක්වූවන්ට ප්‍රතිකාර ලබා ගැනීමට සී. බී. ඩන්බාර් රෝහල තුළ විශේෂ ඒකකයක් පිහිටවීමට මූලිකත්වය ගත් ඇය, ලිංගික අපයෝජනයට ලක්වූවන්ට සාධාරණය ඉටු කිරීමේ වැදගත්කම සලකා බැලීමට වෛද්‍ය අධ්‍යක්ෂකවරුන් සහ රෝහල් පරිපාලන නිළධාරීන්ව පෙළඹවූවාය.

“මම සුපිළිපන්භාවය යන්නෙන් අදහස් කරන්නේ නිවැරදිව රාජකාරි කටයුතු කිරීමයි. අල්ලස දූෂණයෙන් තොරව නිවැරදිව රාජකාරී කරන්න. කිසිම දෙයකට ඔබේ රැකියාව පාවා නොදෙන්න. දූෂණයෙන් තොරව ජනතාවට සේවය කරන්න.” යන්න ඇය පැවසූ අදහසයි.




## පී. කරුණාරත්න බණ්ඩාර

### කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ

## සුපිළිපන් ප්‍රණාම - 2018 ජයග්‍රාහක

සැමවිටම සුපිළිපන්ව තම රාජකාරීයේ යෙදීමට උත්සහ දරන කරුණාරත්න බණ්ඩාර මහතා ඒ හේතුවෙන්ම තම පළාතේ බලවත්ම දේශපාලන අධිකාරියත් සමග ගැටී ස්ථාන මාරුවකට ලක්වුවෙක්. එහෙත් ඔහු තමාගේ ප්‍රතිපත්ති රකිමින් සිදුවූ අගතිය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා ගොස් ඔහු ගත තීරණයේ නිවැරදි බව ඔප්පු කළේය. විදුහල්පතිවරයෙක් ලෙසද ඔහු සේවා කළ කාලය සලකා බලන විට ජනතා සේවයට කරුණාරත්න බණ්ඩාර මහතා දක්වන ඇල්ම කැපී පෙනෙන්නේය.




# පී.ඒ.සී. ප්‍රියදර්ශනී

### විදුහල්පති, මතුගම ශාන්ත මේරි විදුහල

## සුපිළිපන් ප්‍රණාම - 2019 ජයග්‍රාහක

රජයේ පාසල් වල පළමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කිරීමේදී පවතින දූෂණ හා අක්‍රමිකතා සාමාන්‍ය ජනතාව වාර්ෂිකව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි. මතුගම ශාන්ත මේරි විදුහලේ විදුහල්පතිනිය, ප්‍රියදර්ශනී මෙනවිය එවැනි දූෂණ අවම කිරීමට සහ වැලක්වීමට විශේෂ ලකුණු ක්‍රමයක් සකස් කරනු ලැබුවාය. මෙම කුසලතාවය මත පදනම් වූ, බඳවා ගැනීමේ ක්‍රමය හේතුවෙන් ඇයට ඇයගේ ප්‍රජාවේ සියල්ලන්ගෙන් ඉමහත් ප්‍රශංසාවක් දිනා ගැනීමට හැකි වුවා මෙන්ම ඇය දේශපාලන බලධාරීන්ගේ කෝපයටද දිරියෙන් යුතුව මුහුණ දුන්නාය. ශාන්ත මේරි විදුහලේ පවතින සීමිත සම්පත් ප්‍රමාණය කාර්යක්ෂමව භාවිතා කරමින් ඊ - පුවරු හා නවීන ක්‍රීඩා උපකරණ ආදී පහසුකම් දක්වා පාසැල සංවර්ධනය කිරීම හේතුවෙන් ඇය ප්‍රශංසාවට හා ගෞරවයට පාත්‍ර වී ඇත.



# ඉනෝකා හිමාලි රත්නවීර

### ප්‍රාදේශීය ලේකම් - ගාල්ල කඩවත්සතර

## සුපිළිපන් ප්‍රණාම - 2020 ජයග්‍රාහක

රාජ්‍ය අංශයේ සේවාවන් අතරින් පුරවැසියන්ට වඩාත් ම සමීප ස්ථානයක් වන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි. සිය එදිනෙදා අවශ්‍යතාවයන් රැසකට අදාළ සේවාවන් ලබා ගැනීමට පුරවැසියන් විශාල ප්‍රමාණයක් දෛනිකව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැමිණෙයි. ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් ඉනෝකා හිමාලි රත්නවීර මහත්මිය සිය කාර්යාලය සමඟ ගනුදෙනු කරන ජනතාවට ඉතා විශ්වසනීය සහ කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා අල්ලස සහ දූෂණයට ඇති ඉඩකඩ අවම කිරීමට, පවතින තාක්ෂණයේ නවීණත්වය සමඟ යාවත්කාලීන වන සේවා ස්ථානයක් ඇති කිරීමට සමත් වී ඇත. විශේෂයෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ සිදුවුණු ප්‍රදේශයේ රජයේ පාසල් වලට දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා ඡන්ද හිමි නාමලේඛනයට අයතා ලෙස නම් ඇතුළත් කිරීමේ ගැටළුව හඳුනා ගත් ඇය අදාළ ග්‍රාම නිලධාරී වසම්වලට නවක ග්‍රාම නිලධාරීන් අනියුක්ත කරමින් ඔවුන්ව පුහුණු කරමින් මෙම තත්ත්වය අවම කිරීමට සහ වැලක්වීමට ක්‍රියා කළාය. විවිධ ආපදා තත්ත්ව වලදී රජයෙන් ලැබෙන සහන සාධාරණව ජනතාවට ලබාදීමට කටයුතු කිරීමේදී මෙන්ම තම රාජකාරිය නිවැරදිව ඉටු කිරීම නිසාම විවිධ අවස්ථා වලදී ඇය වෙත එල්ල වුණු දේශපාලන බලධාරීන්ගේ බලපෑම් සහ තර්ජන වලට ඉතා දිරියෙන් මුහුණ දුන් ඇය පුරවැසියන්ගේ ඉමහත් ප්‍රශංසාවට ලක් වූවාය.

# 03. යෝග්‍යතාවය

ජනතාව සමග කටයුතු කිරීමේදී සුපිළිපන්තාවය ප්‍රදර්ශනය කර ඇති සහ තම දෛනික සේවාව අභිබවා යමින් සමාජ සුභසිද්ධිය උදෙසා කටයුතු කර ඇති රාජ්‍ය සේවකයන් මෙම තරඟයට ඇතුලත් වීමට සුදුසුකම් ලබයි. ඔවුන්ගේ චර්යාව ආදර්ශමත් සහ අගය කළ හැකි මට්ටමක තිබිය යුතු අතර ඵලදායී සමාජයක් බිහි කිරීමට ප්‍රජාව පොළඹවන මට්ටමේ නායකත්වයක් සහිත අයෙක් විය යුතුය. ප්‍රාදේශීය මට්ටමින් නිළධාරින් හට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. විශ්‍රාමලත් රජයේ නිලධාරින් හෝ කොන්ත්‍රාත් පදනම මත රාජ්‍ය සේවයේ කරන නිළධාරින් මෙම සම්මාන සඳහා සුදුසුකම් නොලබයි.

අයදුම්කරු,

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- රජයේ කාර්යාලයක, නියෝජිතායතනයක හෝ දෙපාර්තමේන්තුවක පූර්ණකාලීන ලෙස සේවයේ නියුතු විශ්‍රාම ලැබීමට තව දුරටත් අවම වශයෙන් වසර 5 ක සේවා කාලයක් සැපිරීමට ඇති පූර්ණ කාලීන ලෙස සේවයේ නිරත සේවකයෙකු විය යුතුය.
- සුපිළිපන් ප්‍රණාම සම්මානය සඳහා නාම යෝජනා ලබා දෙනු ලබන අවස්ථාව වන විට රජයේ රැකියාවක අවම  වශයෙන් වසර 5ක කාලයක් නිරත වී සිටිය යුතුය.
- රජයේ නිලධාරියෙකු/ සිවිල් සේවකයෙකු ලෙස අවංක භාවයෙන් යුතුව තම රාජකාරි සහ වගකීම් ඉටු කර තිබිය යුතු වේ.
- කිසියම් අපරාධමය වරදකට හෝ කිසියම් ආකාරයක බලය අයුතු ලෙස භාවිතා කිරීමක් සම්බන්ධයෙන් වරදකරුවකුවී හෝ අධි චෝදනා ලබා නොතිබිය යුතු වේ.
- විනිසුරු මඩුල්ලේ තීරණයට අනුගතව කටයුතු කළ යුතු වේ.
- කොවිඩ් 19 මැඩලීමට ඉදිරිපෙළ සිට ක්‍රියාකරන රාජ්‍ය සේවකයකු විය යුතුයි.
- ප්‍රවර්ධන කටයුතු සඳහා තම ඡායාරූප, වීඩියෝ සහ අනෙකුත් දායකත්වයන් ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කළ යුතුයි.

### ශ්‍රී ලංකාවේ රාජ්‍ය නිළධාරීන් යනු

රාජ්‍ය නිළධාරීන් යන්නට දැනට සේවයේ නියුතු සියලුම ස්ථිර රාජ්‍ය සේවකයන් ඇතුලත් වන අතර ඊට අමතරව රාජ්‍ය අංශයට අයත් අධිකාරී, මණ්ඩල, ආරක්ෂක සේවා හෝ රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර ආයතන හා සම්බන්ධ ස්ථිර සේවයේ නියුතු සේවකයන්ද මෙම සම්මාන උළෙල සදහා ඉල්ලුම් කල හැකිය.

### සුපිළිපන්භාවය යනු කුමක්ද ?

දූෂණයෙන් තොරවීම යන්න සුපිළිපන්භාවය යන්නෙහි මූලික අදහස වුවද තම සේවාවන් ලබා දීමේදී සුවිශේෂී ප්‍රයත්නයක් හෝ සමාජ කැපකිරීමක් සිදු කරනු ලබන අයෙකු වෙමින් සහ දැඩි සදාචාරාත්මක ප්‍රතිපත්ති අනුගමනය කරමින් මහජනතාව සමග කටයුතු කිරීම සඳහා සුවිශේෂ කැපවීමක් ප්‍රදර්ශනය කරන අවංක පුද්ගලයන් හඳුනාගැනීම ලෙස සුපිළිපන්භාවය යන වචනය සඳහා පුළුල් අර්ථකතනයක් අප විසින් ලබා දි ඇත.

# 04. නිර්ණායක

නාමයෝජනාවක් තුළ පහත සඳහන් නිර්ණායක සපුරා තිබිය යුතු වේ:

- සිදුකරන ලද කාර්යයන් විසින් ඇති කරන ලද බලපෑමෙහි සුවිශේෂීභාවය
- පුද්ගලික විෂය පථයන් ඉක්මවා යමින් පහත සඳහන් ක්ෂේත්‍ර වෙත මෙම කාර්යය / ප්‍රයත්නය තුළින් සිදු කර තිබිය හැකි බලපෑමේ ප්‍රමාණය,
  - ආයතනය
  - ප්‍රාදේශීය ප්‍රජාව
  - ජාතික මට්ටම
  - අන්තර්ජාතික තලය
- එවැනි තනතුරක් දරන පුද්ගලයෙකුට ප්‍රබල හෝ දුෂ්කර ලෙස දැනෙන ප්‍රබල අභියෝග ජය ගන්නා ලද ප්‍රමාණය
- සාධනීය බලපෑමක් ඇති කිරීම සඳහා පුද්ගලික, ආර්ථික, භෞතික, සමාජීය, වෘත්තීයමය හෝ ආයතනමය වශයෙන් සිදු කරන ලද කැප කිරීම් ප්‍රමාණය
- තමා සිදු කරන ලද කාර්යයන් රාජ්‍ය සේවය තුළ මිනුම් දණ්ඩක් ලෙස භාවිතා කිරීමේ හැකියාව
- තමා විසින් දරනු ලබන තනතුර මගින් ලබා දෙන ලද අවස්ථාව කොතරම් දුරකට තමාට ඉටු කිරීමට ඇති කාර්යයන්හි නිරත වීම සඳහා බලපෑමක් ඇති කිරීමට යොදා ගත හැකිද යන බව
- මෙලෙස නාමයෝජනා ලබා දී ඇත්තේ හුදෙක්ම සමාජය තුළ සිදු කරන ලද යහපත් කාර්යයන් නිසා නොව සුපිළිපන්නතාවය හේතු කොටගෙන බව පැහැදිලි විය යුතු වේ.
- මෙහිදී කොවිඩ් 19 වසංගතය මැඩපැවැත්වීමට කරන ලද දායකත්වය හා කාර්යයන් සැලකීමට ගනු ලැබේ.

# 05. සුපිළිපන් ප්‍රණාම වැඩසටහන සංවිධාන ක්‍රියාවලිය

| | |
|---|---|
| **2021 ජූලි** | විනිසුරු මඩුල්ල පත් කර ගැනීම |
| **2021 ජූලි/සැප්තැම්බර්** | සුපිළිපන් ප්‍රණාම සම්මාන උළෙලෙහි ප්‍රචාරක කටයුතු ආරම්භ කිරීම<br>මුද්‍රිත, විද්‍යුත් මාධ්‍ය හා අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත් කැඳවීම<br>අයදුම්පත් වර්ගීකරණය හා නුසුදුසු අයදුම්පත් ඉවත් කිරීම |
| **2021 සැප්තැම්බර්/ ඔක්තෝම්බර්** | අයදුම්කරුවන්ගේ තොරතුරු තහවුරු කර ගැනීම |
| **2021 ඔක්තෝම්බර් - නොවැම්බර්** | විනිසුරුමඩුල්ල විසින් අවසාන වටයට අපේක්ෂකයන් දස දෙනෙකු තෝරාගැනීම |
| **2021 නොවැම්බර්** | විනිසුරුමඩුල්ල විසින් අපේක්ෂකයන් දස දෙනා අතරින් අවසාන ජයග්‍රාහකයින් පස් දෙනා තෝරාගැනීම |
| **2021 දෙසැම්බර්** | සම්මාන උළෙල පැවැත්වීම |

තෝරාගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇමුණුම් (B) හි දැක්වේ

# 06. නාමයෝජනා කැඳවීම

ඕනෑම කෙනෙකුට තමන්ව හෝ වෙනත් අයෙකු අපේක්ෂකයෙකු ලෙස නම් කිරීම සිදු කළ හැකිය. (නාමයෝජනා ආකෘති පත්‍රයක නිදර්ශකයක් ඇමුණුම A හි අඩංගු වේ.) පහත සඳහන් මාර්ග ඔස්සේ නාමයෝජනා ආකෘති පත්‍ර ලබා ගතහැකිය.

- වෙබ් අඩවිය [www.integrityicon.lk]
- විද්‍යුත් තැපෑල [icon@tisrilanka.org]
- ලිඛිතව හෝ මුද්‍රණය කරන ලද ආකෘතිපත්‍ර අංක 5/1, එලිබෑන්ක් පාර, කොළඹ 05 පිහිටි ශ්‍රී ලංකා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයේ කාර්යාලයට පැමිණ අතින් භාර දීම හෝ තැපැල් මගින් එවීම සිදු කළ හැකිය.

| |
|---|
| අප ආයතනය අගෝස්තු 15 වන දින තෙක් ඉහත ලිපිනයේ වැඩ කටයුතු කරන අතර ඉන්පසු (අගෝස්තු 15 පසු) අප ආයතනය නො 366, නාවල පාර, රාජගිරිය යන ලිපිනයට මාරුවන බව කරුණාවෙන් සලකන්න |

වැඩිපුර තොරතුරු ලබාගැනීමට ඔබට අවශ්‍ය නම් අපගේ ක්ෂණික ඇමතුම් අංකය අමතන්න

**071 1 295 295 / 076 3 223 442**

# 07. විනිසුරු මඬුල්ල

සමාජය තුළ පිළිගැනීමක් සහිත සහ සුපිළිපන්නාවය තම චර්යාව තුළින් පෙන්නුම් කර ඇති ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් පත් කරනු ලැබූ විශිෂ්ඨ පුද්ගලයන් පස් දෙනෙකුගෙන් විනිසුරු මඬුල්ල සමන්විත වන අතර ඔවුන් විසින් අයදුම්පත්‍ර ඇගයීමට ලක් කරනු ඇත. තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී විනිසුරු මඬුල්ල විසින් ඉහළ සුපිළිපන්නතා මට්ටමක් පවත්වාගෙන යනු ලබන අතර පහත සඳහන් කාර්යයන් ඔවුන් විසින් ඉටු කරනු ඇත:

- නාමයෝජනා කැඳවීමට පෙර ඇගයීම් ක්‍රියා පටිපාටිය සහ මාර්ගෝපදේශ සමාලෝචනයට ලක් කිරීම
- නාමයෝජනාවන් සම්බන්ධව බැඳියාවන් පිළිබඳ ගැටුමක් ඇති අවස්ථාවකදී ඡන්දය දීමෙන් වැලකී සිටීම
- කිසියම් නාම යෝජනාවක් පිළිබඳව වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් එම තොරතුරු ලබා දෙන ලෙස නාමයෝජනාව සිදු කළ පුද්ගලයාගෙන් ඉල්ලා සිටීම
- අවශ්‍ය අවස්ථාවලදී වැඩිදුර විමසීම් සිදු කිරීම
- ලබා දෙන ලද තොරතුරු ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී නාම යෝජනාව සලකා බැලීම ප්‍රතික්ෂේප කරීම
- ලබා දෙන ලද තොරතුරු සනාථ කර ගැනීම සඳහා හෝ වැඩිපුර තොරතුරු/ සාක්ෂි ලබා ගැනිම සඳහා අවශ්‍ය නම් සම්මාන සඳහා නම් කරන ලද පුද්ගලයා සේවය කරන ආයතනයට/ ජීවත් වන ප්‍රදේශයට සංචාරයක් සංවිධානය කිරීම
- සුපිළිපන්න ප්‍රණාම සම්මාන සදහා ජයග්‍රායකයින් පස් දෙනා තෝරා ගැනීම
- නාම යෝජනා අවශ්‍ය ප්‍රමිතියට ළඟා වී නොමැති නම් අවසාන වටයට අපේක්ෂකයන් පස් දෙනා තෝරා ගැනීමෙන් වැලකී සිටීම
- වැඩසටහනෙහි සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙහි සුපිළිපන්නතාවය ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී ලබා දෙන ලද නිර්දේශයන් ඉල්ලා අස් කර ගැනීම
- යම් තරඟකරුවකු සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබුණහොත් විනිසුරු මඬුල්ල ඊට අදාල තීන්දු, තීරණ සහ ක්‍රියාමාර්ග ගත යුතුයි
- විනිසුරු මඬුල්ලේ තීරණය අවසාන තීරණය වේ

# 08. සම්මාන ප්‍රදානෝත්සවය

2021 දෙසැම්බර් මාසයේදී සම්මාන ප්‍රදානෝත්සවය පවත්වනු ලැබේ.

මෙරට ජාතික නායකයන් සහ නිළධාරීන් සහභාගි වන සම්මාන උත්සවයකදී ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙහි සහ Accountability Lab ආයතනයෙහි අත්සන සහිත සහතික පත්‍රයක් සහ ජය සංකේතයක් සුපිළිපන්න ප්‍රණාම සම්මාන ජයග්‍රාහකයන්ට පිරිනමනු ඇත. ජයග්‍රහයකයන් පිළිබඳව ජාතික සහ ගෝලීය වශයෙන් දැනුවත්භාවය ඇති කිරීම සඳහා විශේෂ ප්‍රචාරණ සහ මාධ්‍ය ආවරණයන් ලබා දීමට හැකි සෑම විටම අප ආයතනය කටයුතු කරනු ඇත.

පහත සඳහන් අවස්ථාවලදී ලබාදෙන ලද සම්මානයන් ජයග්‍රාහකයන්ගෙන් ආපසු කැඳවිය හැකිය:

▪ සම්මානය ප්‍රදානය කිරීමට අදාල සිය සත්‍ය තොරතුරු වසන් කරමින් සම්මානලාභියා විසින් සම්මාන උළෙල සදහා ඉදිරිපත් වී ඇති බව අනාවරණය වුවහොත්.

▪ සම්මානලාභියාගේ වර්තමාන චර්යාව සුපිලිපන්නතාවය පිලිබඳ සාරධර්මවලට අනුකූල නොවන්නේ නම් සහ බරපතල අපරාධමය වරදකට වරදකරුවකු වූ අවස්ථාවකදී

ඉහත සදහන් අවස්ථාවක දී හෝ සුපිළිපන්න ප්‍රණාම ජයග්‍රාහකයෙක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබුණු අවස්ථාවක දී පහත සදහන් ආකාරයට ක්‍රියාමාර්ග ගනු ඇත.

1. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයේ අදාල නිලධාරීන්/ නිලධාරියා හෝ නිලධාරිනිය විසින් මීට අදාළ සියළු තොරතුරු සහ සාක්ෂි එක් රැස් කරනු ඇත.
2. ඉන් අනතුරුව අදාළ නිලධාරිනිය/ නිලධාරියා විසින් මීට අදාලව සකසනු ලබන ලිපි ගොනුව පැමිණිල්ල සිදු කරනු ලබන අවස්ථාවේ හෝ අදාල සිදුවීම වන අවස්ථාවේ කටයුතු කරනු ලබන සුපිළිපන් ප්‍රණාම වැඩසටහන් විනිශ්චය මණ්ඩලය වෙත යොමු කරනු ලබයි.
3. අදාළ ලිපිගොනු පරීක්ෂා කිරීමෙන් අනතුරුව සහ විනිසුරු මණ්ඩලයේ උපදෙස් මත පැමිණිලි පාර්ශ්වය සහ පැමිණිල්ල හරහා චෝදනා ලැබූ පාර්ශවය යන දෙපාර්ශවයටම පැමිණිල්ලේ ඇති චෝදනා/ කරුණු සම්බන්ධයෙන් වැඩිදුර විස්තර හෝ පැහැදිලි කිරීම් හෝ හෝ අවශ්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමට ඉඩ ලබාදෙනු ඇත. මෙහිදී විනිසුරු මණ්ඩලය විසින් අදාළ පැමිණිල්ල ඉදිරියට රැගෙන යනවාද නැද්ද යන්න සාක්ෂි සහ දෙපාර්ශ්වයටම සවන් දීමෙන් අනතුරුව තීරණය කරනු ලබයි.පැමිණිල්ල ඉදිරියට රැගෙන නොයන්නේ නම් ඊට හේතු සටහන් කළ යුතු වේ. පැමිණිල්ල ඉදිරියට රැගෙන යන්නේ නම් පහත සඳහන් ආකාරයට එය සිදු කළ යුතු වේ.
4. දෙපාර්ශවයේම කරුණු සලකා බලා පැමිණිල්ලට අදාළ අවසාන නිරීක්ෂණ වාර්තාව අදාල විනිසුරු මඩුල්ල විසින් සම්පාදනය කළ යුතු අතර මෙය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කළ යුතු වේ.
5. ඉහත සඳහන් නිරීක්ෂණ වාර්තාව අධ්‍යක්ෂක මණ්ඩලයට යොමු කිරීමෙන් පසු එකී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සුපිළිපන් ප්‍රණාම සංකේතය සහ සහතික පත්‍රය නැවත කැඳවනවාද නැද්ද යන්න තීරණය කරනු ලබයි. සංකේතය සහ සහතික පත්‍රය නැවත භාරදීම සඳහා අවසාන දිනයක් ද තීරණය කළ යුතු වේ. යම් අවස්ථාවක දී අදාළ කාලසීමාව තුළ චෝදනා ලැබූ තැනැත්තා විසින් සංකේතය සහ සහතික පත්‍රය භාර නොදෙන්නේ නම් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කොට තීරණය කල යුතුවේ.

## ඇමුණුම 'A' - නිදර්ශක නාමයෝජනා අයදුම් පත්‍රය

නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කිරීමේ අවසාන දිනය : 2021 සැප්තැම්බර් 06 හෝ එදිනට පෙර.
නිර්දේශිත පුද්ගලයා පිළිබඳව අවශ්‍ය කරනු ලබන තොරතුරු (කරුණාකර හොඳින් කියවා බලා අවශ්‍ය කරනු ලබන තොරතුරු සම්පූර්ණ කරන්න).

නම ..........................................................................................................................................

උපන් දිනය: ........................ වයස: ........................ ස්ත්‍රී පුරුෂ භාවය: ........................

දුරකථන/ජංගම දුරකථන අංකය: ........................ විද්‍යුත් තැපෑල: ........................................

ස්ථිර ලිපිනය: ...............................................................................................................

නගරය: ......................................................... පළාත: ...........................................

දැනට සේවය කරන කාර්යාලයේ නම සහ ලිපිනය : .........................................................................තනතුර:
..........................................................................................

සම්බන්ධ කරගත හැකි දුරකථන අංක ...........................................................................

රාජ්‍ය සේවයට බැඳුනු දිනය : .................. විශ්‍රාම ලැබීමට ඉතිරිව ඇති වසර ගණන : ......
නිර්දේශිත පුද්ගලයාට විරුද්ධව ආයතන මට්ටමින් හෝ නීතිය ආරක්ෂා කිරීමේ ආයතනයක පැමිණිල්ලක් හෝ පැමිණිලි විභාග වෙමින් පවතීද? ඔව් නම් අදාල විස්තර සඳහන් කරන්න ..............................................................

..........................................................................................................................................................

..........................................................................(නිර්දේශිත පුද්ගලයාගේ නම) 2020 සුපිළිපන් ප්‍රණාම සම්මාන සඳහා සුදුසු අයදුම්කරුවෙකු බව තහවුරු කිරීමට පහත සඳහන් ප්‍රශ්නය හොඳින් කියවා බලා තොරතුරු සපයන්න. අවශ්‍ය අවස්ථා වලදී අදාළ උදාහරණ ඇතුළත් කරන්න. අයැදුම්කරු/නිර්දේශිත පුද්ගලයා සිය වෘත්තීය ජීවිතයේ සියලුම අංශ වල දී සුපිළිපන්භාවයෙන් කටයුතු කර ඇති ආකාරය මෙහිදී සලකා බලන බව කරුණාවෙන් සලකන්න.
අයදුම්කරු/නිර්දේශිත පුද්ගලයා සිය පෞද්ගලික සහ වෘත්තීය ජීවිතයේ සියලුම අංශ වල දී සමානාත්මතාවයට ගරු කරමින් සුපිළිපන්භාවයෙන් සහ අවංකභාවයෙන් කටයුතු කරන්නේ කෙසේද? එවන් අවස්ථා 3ක් සඳහා පැහැදිලිව උදාහරණ දක්වන්න. ඔබට තවත් ඉඩ අවශ්‍ය නම් අමතර පිටුවක් භාවිතා කරන්න. (මෙම උදාහරණ මෙම අත්පත්‍රිකාවේ 7 වන පිටුවෙහි සඳහන් නිර්ණායක වලට අනුකූල විය යුතුයි)

1 ..........................................................................................................................................

2 ..........................................................................................................................................

3 ..........................................................................................................................................

ඉහත තොරතුරු වල අදාළ ලිපි ලේඛන ඇත්නම් මේ සමඟ අමුණා එවන්න(උදා- නිර්දේශ/මාධ්‍ය ලේඛන/පුවත්පත් ප්‍රවෘත්ති වාර්තා/ඡායාරූප/වෙබ් අඩවි)

නිර්දේශකරු පිලිබඳ තොරතුරු (නිර්දේශකරු නිර්දේශිත පුද්ගලයා නොවන්නේ නම්)
නම: ........................................................ රැකියාව:....................................................
තනතුර: ................................................... සම්බන්ධතාවය:...............................................
දුරකථන/ ජංගම දුරකථන අංකය : .................. විද්‍යුත් තැපෑල: ...........................................
රට (නිර්දේශකරු රටින් බැහැරව සිටී නම්) : ...........................................................

ඔබ විසින් ලබා දී ඇති තොරතුරු සනාථ කිරීම සඳහා සහ වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා පහත සඳහන් පුද්ගලයන් සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳව තොරතුරු ලබා දෙන්න (මෙම තොරතුරු සැපයීම අත්‍යාවශ්‍ය නොවුව ද නාම යෝජනාලාභියා පිළිබද තොරතුරු විමර්ෂණයට මෙම තොරතුරු උපකාරී වනු ඇත):

ඔබගේ මිතුරෙකු: නම : ................................................ දුරකථන අංකය:.....................................ආයතන

ප්‍රධානියාගේ නම : ................................................ දුරකථන අංකය:..........................

වෙනත් : නම: ................................................ දුරකථන අංකය:..........................

ඉහත සඳහන් සියලුම තොරතුරු නිවැරදි සත්‍ය වන බවට මා ප්‍රකාශ කරන අතර එම තොරතුරු වැරදි බව සනාථ වුවහොත් මා/නිර්දේශ කරන ලද පුද්ගලයා සුපිළිපන් ප්‍රණාම සම්මාන 2020 සඳහා නුසුදුස්සකු වනු ඇත.

................................................
අත්සන

ඔබ සුපිළිපන් ප්‍රණාම 2021 පිළිබඳව දැන ගත් මූලාශ්‍රය කුමක්ද? සමාජ මාධ්‍ය/වෙබ් අඩවි/මුද්‍රිත මාධ්‍ය/විද්‍යුත් මාධ්‍ය/පෝස්ටර්/වෙනත්

## ඇමුණුම 'B' - නිදර්ශක නාමයෝජනා අයදුම් පත්‍රය

### 1 පියවර : නාමයෝජනා භාර දීම

සියලුම නාමයෝජනා ආකෘතිපත්‍ර දත්ත පදනමකට ඇතුළත් කරනු ලබන අතර වෙබ් අඩවිය හරහා ලැබෙන විද්‍යුත් නාමයෝජනා ආකෘතිපත්‍ර ද ඒ සමග සම්බන්ධ කරනු ලැබේ.

### 2 පියවර : වලංගුභාවය සනාථ කිරීම

වලංගුභාවය සනාථ කිරීමේ මූලික පියවර යටතේ ඉදිරිපත් කරන ලද අයදුම්පත්වල ඇතුළත් තොරතුරු වල සනාථ භාවය තහවුරු කර ගැනීමට නොහැකි වන අවස්ථාවන්හිදී එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 3 පියවර - සාධාරණීකරණය

දෙවන පියවරෙන් පසු ඉතිරි වන අයදුම්පත් තවදුරටත් වර්ගීකරණය කරමින් සුපිළිපන්න ප්‍රණාම සම්මානය සඳහා සුදුසුකම් ලැබීමට යෝග්‍ය සුවිශේෂී කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සාධාරණීකරණය කරනු ඇත.

### 4 පියවර - මූලික විමර්ශනය

3වන පියවරෙන් පසු හඳුනා ගනු ලබන අයදුම්පත් මූලික විමර්ශනයට භාජනය කරනු ලැබේ. මෙහිදී ස්වේච්ඡා පුද්ගල කණ්ඩායමක් විසින් දුරකථන මාර්ගයෙන් අයදුම්කරුවා හා සම්බන්ධ වීමෙන් හා අවශ්‍ය විටක එම මූලික පර්යේෂණ හෝ ක්ෂේත්‍ර විමර්ශන සිදුකරමින් අයදුම්කරු පිළිබඳ මූලික විමර්ශණය කරනු ලැබේ.

### 5 පියවර - සමාලෝචනය

මූලික විමර්ශන වලින් අපේක්ෂකයින් 20 දෙනෙකු හෝ 30 දෙනෙක් තෝරා ගන්නා අතර ඔවුන් පිළිබඳව තව දුරටත් පහත සඳහන් ආකාර වලින් විමර්ශන සිදු කෙරේ.

- අදාළ ආයතන ප්‍රධානීන් සහ සේවා ස්ථානයේ අනෙකුත් සේවකයින් සමඟ දුරකථන සංවාද
- අයදුම්කරුගේ සමාජ මාධ්‍ය ගිණුම්වල අන්තර්ගතය පරීක්ෂා කිරීම

ඒ අතරින් තෝරා ගන්නා අපේක්ෂකයින් 10 දෙනා සඳහා ප්‍රජා මට්ටමේ විමර්ශන සිදු කෙරෙනු ඇත.(උදා- අයදුම් කරුවන්ගේ සේවා ස්ථාන වලට පැමිණ ඔවුන්ගෙන් සේවාවන් ලබා ගන්නා පුරවැසියන් සමඟ අහඹු ලෙස සිදු කරන සම්මුඛ සාකච්ඡා)

### 6 පියවර - විනිශ්චය කිරීම

මෙහිදී සංවිධායක කණ්ඩායම විසින් විනිසුරු මඩුල්ලක් තෝරාගනු ලැබේ. මෙම විනිසුරුවරුන් අදාළ රට තුළ මනා ගෞරවාදරයට පාත්‍ර වූ අපක්ෂපාති හා විෂයමූලික ලෙස කටයුතු කරන පුද්ගලයන් වීම අත්‍යවශ්‍ය වේ. උදාහරණ ලෙස දූෂණ විරෝධී කොමිෂන් සභාවක හිටපු ගෞරවනිය ප්‍රධානියෙකු, සුපිළිපන්නතාවය සහිත ප්‍රසිද්ධ විනිසුරුවරයෙකු, අවංකභාවය පිළිබඳව නිරන්තරව හඬ නගන සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකු මෙම විනිසුරු මඩුල්ලට ඇතුළත් කර ගත හැකිය. විනිසුරුමඩුල්ලට අයත්වන පුද්ගලයන් සංඛ්‍යාව 3 සිට 5 දක්වා විය හැකි අතර (බහුතර තීරණය තහවුරු කිරීමට ඔත්තේ සංඛ්‍යාවක් සකස් කිරීම සුදුසු වේ.)

නාම යෝජනා කරනු ලැබ ඇති ප්‍රධාන අපේක්ෂකයන් 20 දෙනා හෝ 30 දෙනාගේ පසුබිම් තොරතුරු, ඔවුනගේ ජීවන රටාව පිළිබඳ තොරතුරු සහ ඔවුන් පිළිබඳව කරන ලද සම්මුඛ සාකච්ඡා තිබේ නම් ඒවායේ සටහන් යනාදි පසුබිම් තොරතුරු හැකිතාක් ප්‍රමාණවත් ලෙස විනිසුරු මඩුල්ල වෙත ලබා දීම සංවිධායක කණ්ඩායම විසින් සිදු කළ යුතු වේ.

සෑම විනිසුරුවරයෙකුගේම ඡන්දය සඳහා සමාන වටිනාකමක් ඇත.

### 7 පියවර : තහවුරු කිරීම

තොරතුරුවල වලංගුභාවය තහවුරු කර ගැනීම, අපේක්ෂකයන්ගේ චරිතයෙහි ඇති සුපිළිපන්නතාවය තහවුරු කර ගැනිම සඳහා සංවිධායක කණ්ඩායම විසින් ඉහළම ප්‍රමුඛතාව ලැබූ නිර්දේශිත පුද්ගලයන් හමුවීම සිදු කළ යුතු අතර, විනිසුරු මඩුල්ලේ ඉල්ලීම මත වැඩිදුර පරීක්ෂා කිරීම් සිදු කිරීම කණ්ඩායම විසින් සිදු කරනු ලැබේ.

ප්‍රමුඛතාවය ලැබූ ප්‍රධාන අපේක්ෂකයන් දස දෙනාගෙන් එක් අයකුට කිසියම් වූ හේතුවක් මත සහභාගිවිය නොහැක්කේ නම් හෝ තරඟයෙන් ඉවත් කරන ලද්දේනම් ප්‍රමුඛතාවය ලැබූ එකොලොස්වන පුද්ගලයා ඉදිරියට කැඳවන අතර අවසාන වටයට අපේක්ෂකයන් පස්දෙනෙකු තෝරා ගන්නා තෙක් එලෙස ඉවත් වන අපේක්ෂකයන් වෙනුවට ඊළඟට ප්‍රමුඛතාවය ලැබූ අපේක්ෂකයා තෝරාගනු ලැබේ.

ප්‍රමුඛතාවය ලැබූ ප්‍රධාන අපේක්ෂකයන් දස දෙනා ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත් හෝ අන්තර්ජාල සේවාවන් සමඟ සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගිවීම, සුපිළිපන් ප්‍රණාම සම්මානයට අදාළ ඡායාරූප සහ තොරතුරු හුවමාරු කර ගැනීම මෙන්ම සම්මාන උළෙල සඳහා සහභාගිවීම සඳහා මෙරට තුළ උත්සවය පැවැත්වෙන ස්ථානය කරා ගමන් කිරීමට කැමැත්ත ප්‍රකාශ කළ යුතු වේ.

## ඇමුණුම 'C' - නිදර්ශක නාමයෝජනා අයදුම් පත්‍රය

ජාතික සුපිළිපන් ප්‍රණාම සම්බන්ධීකාරක,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය
නො 5/1, එළිබෑන්ක් පාර, කොළඹ 06

අයදුම්කරුගේ නම

ලිපිනය

දිනය

### එකඟතා ලිපිය

1. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කරනු ලබන සුපිළිපන් ප්‍රණාම 2020 සඳහා මාගේ නම යෝජනා කරනු ලැබ ඇති බව ( මා දන්නා /මාහට දැනුම් දෙනු ලැබ ඇති) බව මෙමගින් තහවුරු කරමි.

2. එකී නාම යෝජනාව සඳහා මගේ කැමැත්ත ප්‍රකාශ කරමි.

3. සුපිළිපන් ප්‍රණාම සඳහා අවසාන වටයට මගේ නම තෝරාගනු ලැබුවහොත් ඒ පිළිබඳව ප්‍රසිද්ධ කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට මම අවසරය ලබා දෙමි.

4. මගේ නාම යෝජනාව සම්බන්ධ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පුද්ගලිකව විමසා බැලීම් සිදුකිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ට නැෂනල් ශ්‍රී ලංකා ආයතනයට මම අවසරය ලබා දෙමි.

5. මාගේ නාම යොජනා පත්‍ර ට්‍රාන්ස්පේරන්සි ඉන්ට නැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙහි දේපළක් වන බවත් නාම යෝජනා පත්‍රයක් ඉදිරිපත්කළ පසු සුපිළිපන් ප්‍රණාම සම්මාන වැඩසටහන සහ සුපිළිපන් ප්‍රනාම සම්මාන උත්සවය හා සම්බන්ධව ඕනෑම මාධ්‍යයක් ඔස්සේ දේශිය හා විදේශීය වශයෙන් සිදුකරනු ලබන සියලුම ප්‍රචාරණ කටයුතු සඳහා නාම යෝජනාලාභියකුගේ හඩ පට සහ ඡායාරූපය කිසිදු ගෙවීමක් සිදුකිරීමකින් තොරව යොදා ගැනීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට අයිතිය ඇතිබව මම පිළි ගනිමි.

6. නාමයෝජනාලාභියකු ලෙස, මා දැනුවත්කිරීමකින් සහ මගේ ලිඛිත අනුමැතිය ලබා ගැනිමකින් තොරව මා පිළිබඳ පුද්ගලික තොරතුරු කිසිවක් එක්රැස් කිරීමට ගබඩා කිරීමට සහ භාවිතා කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට අවසරය ලබා නොදෙමි. මා පිළිබඳ පුද්ගලික තොරතුරු විනිසුරු මණ්ඩලය විසින් මගේ නාමයෝජනා පත්‍රය ඇගයීමට ලක් කිරීමේ කාර්ය සඳහා පමනක් භාවිතා කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට මම අවසරය ලබා දෙමි.

7. සුපිළිපන් ප්‍රතිඥාව ලබා දීමටත් සුපිළිපන්නතාවයෙහි ඉහළම ගුනාත්මකභාවය සදාකල් සුරැකීමටත් මම එකඟ වෙමි.

8. නාම යෝජනා ලාභියෙකු ලෙස මා කිසියම් අපරාධමය වරදකට හෝ දූෂණ ක්‍රියාවකට හෝ බලය අවභාවිතා කිරීමකට වරදකරු වී නොමැති බවත් ශ්‍රී ලංකාව හෝ ඉන් පිටතදී අධි චෝදනාවකට ලක් වී නොමැති බවත් මෙයින් දැනුම් දෙමි.

ඔබගේ විශ්වාසී

අත්සන ..........................................................

නම ..........................................................

දිනය .............................................

## ඇමුණුම 'D' - සුපිළිපන් ප්‍රතිඥාව

සුපිළිපන් දේශයක් මතු පරපුරට දායාද කිරීමේ උතුම් පරමාර්ථයෙන් ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ද මිනිස් අයිතිවාසිකම් හා යුතුකම් ද සුරැකීම වෙනුවෙන් පුරෝගාමීව කැප වෙමින් මනුෂ්‍යත්වයට හා රටේ ප්‍රගමනයට අහිතකර කවර බලවේගයක් අභිමුව වුව අකම්පිතව පෞද්ගලික හා වෘත්තීය ජීවිතයේදී මනා විනිවිද භාවයකින් ද වගවීම හා වගකීමට කැප වූ දෘෂ්ටියකින්ද යුත් දුසැරියෙන් තොර හරසැරි ශ්‍රී ලාංකේය පුරවැසියෙකු සේ ජීවත් වන බවට හා සේවය කරන බවට ................................................ ......................................... වන මම දැඩි අධිෂ්ඨානයකින් යුක්තව ප්‍රතිඥා දෙමි.

අත්සන ..............................

දිනය ..............................

## ඇමුණුම 'E' - නාමයෝජනාව සිදු කරන පුද්ගලයා විසින් දෙනු ලබන ප්‍රතිඥාව

සුපිළිපන් සාරධර්ම ගරුකරන ශ්‍රී ලාංකික පුරවැසියකු ලෙස මා විසින් ප්‍රතිඥා දෙනු ලබන වග නම්

- ■ නාමයෝජනාලාභියා සුපිළිපන් ප්‍රණාම අත්පොතෙහි නියමකර ඇති නිර්නායක සපුරා ඇති බවත් ඔහු සුපිළිපන්නතාවය පිළිබිඹු කරනු ලබන ක්‍රියා තුළින් ජනතාවට සේවය කරන නීති ගරුක පුද්ගලයකු බවත්

- ■ රජයේ නිලධාරියකු /සිවිල් සේවකයකු ලෙස නාමයෝජනාලාභියා විසින් තම වගකීම් සහ රාජකාරී සුපිළිපන්නතාවය සහිතව ඉටුකර ඇති බවත්

- ■ නාමයෝජනාලාභියා කිසියම් අපරාධමය වරදකට, දූෂණ ක්‍රියාවකට හෝ බලය අවභාවිතා කිරීමකට වරදකරු වී නොමැති බවත් නැතහොත් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත අධිචෝදනාවට ලක් කර නොමැති බවත්

- ■ නාමයෝජනාව සිදු කරන පුද්ගලයා ලෙස මා කිසියම් අපරාධමය වරදකට, දූෂණ ක්‍රියාවකට හෝ බලය අවභාවිතා කිරීමකට වරදකරු වී නොමැති බවත් නැතහොත් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත අධිචෝදනාවට ලක් කර නොමැති බවත්ය.

නාමයෝජනාකරුගේ නම ..............................

අත්සන ..............................

දිනය ..............................

TRANSPARENCY INTERNATIONAL SRI LANKA

a nation that upholds integrity

accountabilitylab

071 1 295 295 076 3 223 442

www.integrityicon.lk icon@tisrilanka.org